ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

576

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන -3 වන මට්ටම

**2022/2023 - අවසාන පරීක්ෂණය**

**EPU3331 - මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක**

**කාලය - පැය දෙකයි. (02)**

---

**දිනය - 2024.02.18** **වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා**

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 - වන කොටස

01. ළමා සංවර්ධනයේ ප්‍රධාන අංශ හතර (04) කෙටියෙන් විස්තර කර එම අංශ සමස්ත සංවර්ධනයට දායක වන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

02. "ළමා කේන්ද්‍රිය අධ්‍යාපනය " යන්න ගුරුවරයාගේ භූමිකාවක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට සම්බන්ධ ගැටලු පහක් (05) සඳහන් කරන්න.

04. "සැමට අධ්‍යාපනය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණයක් සමඟ පැහැදිලි කරන්න.

05. "21 වන සියවසේ ස්වයං ඉගෙනුම ඉතා වැදගත් වේ"

    ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු තුනක් (03) ලබා දෙන්න.

06. සුදුසු නිර්වචනයක් යොදාගනිමින් පවුල යන සංකල්පය නිර්වචනය කරන්න.

07. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වර්ග දෙකක් (02) සඳහන් කර ඉන් එක් වර්ගයක ලක්ෂණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ අවසාන පරමාර්ථය ළඟාකර ගැනීමට දායකවන නිපුණතා හත (07) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 - වන කොටස

09. (i.) දරුවාගේ සමස්ත සංවර්ධනය යනුවෙන් ඔබ අදහස් කරන්නනේ කුමක්ද? (ලකුණු -5)

(ii.) "පාඩම් සැලසුමක අරමුණු සහ සුවිශේෂී අරමුණු ඉතා වැදගත් අංග දෙකක් වේ" අරමුණු සහ සුවිශේෂී අරමුණු වලට උදාහරණ එක බැගින් ලබා දී ඒවා පාඩමේ සාර්ථකත්වයට දායක වන අයුරු කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු -7)

(iii.) කායික (Physical) ක්‍රියාකාරකම් දරුවන්ගේ සමස්ත සංවර්ධනයට දායක වන අයුරු උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු -8)

10. (i.) ශ්‍රී ලංකාව තුළ දැකගත හැකි පවුල් වර්ග වල ස්වභාවයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

(ii.) "ශ්‍රී ලංකා සමාජයේ සම්ප්‍රදායික පවුල් වල ව්‍යුහය වෙනස්වීම් වලට භාජනය වී ඇත."

ඉහත වෙනස්කම් සිදුවීමට බලපෑ හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු -7)

(iii.) කේවල දෙමව්පියන් ඔවුන්ගේ දරුවන් රැකබලා ගැනීමේදී මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු තුනක් (03) උදාහරණ දක්වමින් විශ්ලේෂණය කරන්න. (ලකුණු -8)

11. (i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට 1992 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා හඳුන්වා දුන් ප්‍රධාන වෙනස්කම් හතරක් (04) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු -6)

(ii.) 1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණය හරහා ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වාදෙන ලද සුවිශේෂී සංවර්ධනාත්මක වෙනස්කම් විශ්ලේෂණය කරන්න. (ලකුණු -7)

(iii.) 1999 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමත් සමඟ ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ භූමිකාව වෙනස් වූ අයුරු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු -7)

12. (i.) විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සහ විශේෂ තත්වයන් යටතේ සිටින ළමුන් අතර ඇති වෙනස විශ්ලේෂණය කරන්න. (ලකුණු -5)

(ii.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සාමාන්‍ය පන්ති කාමරයේ ඉගෙන ගන්නා විට මුහුණ දෙන ගැටළු හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු -7)

(iii.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමඟ ප්‍රාථමික පාසල් ගුරුවරියක් වැඩ කරන විට ඔහු හෝ ඇයගේ භූමිකාව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු -8)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i.) දරුවන්ට සහභාගිත්වය සඳහා ඇති අයිතිය.

(ii.) "5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අදාළව පවතින ගැටලු"

(iii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්.

(iv.) පළමු වන ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීම සම්බන්ධ ගැටලු.

(ලකුණු 10 x 2 = 20)

-සියළුම හිමිකම් ඇවිරිණි.-